# ජීවය රැක ගන්නට පස රැක ගන්න

ස්වභාව ධර්මයා විසින් මිනිසා වෙත පරිත්‍යාග කරන ලද අනගිතම දයාදයක් වන පස රැක ගැනීම මිනිසාගේ පරම යුතුකමෙකි. සෝදපාළුවෙන් පස ආරක්ෂාකර නොගතහොත් ඉන්දිය සාගරයේ මුතු ඇටය වන අප දිවයින ඉන්දිය සාගරයෙහි දියව යා හැකිය.

මීට අවුරුදු ලක්ෂ ගණනකට පෙර පස ඇති වුණේය. මුල් ම පස අලි ගිනි ගුළියෙක් විය. මේ අලි ගිනි ගුළිය සිහිල් වී එහි පිට පැත්ත කිසිවක් නොවැඩුණු දැඩි පාෂාණයක් බවට පෙරළිණ. කඳු මත හෝ තැනි මත හෝ පස නො තිබුණි එකල. ශාක, සත්තු, කුරුල්ලෝ, කෘමිහු හෝ මිනිස්සු හෝ එකල නොවූහ. පොළොව මත කිසිවක් ජීවත් වූණේ ද නැති. තිබුණේ නදී, විල්, මුදු හා හිස් පාෂාණ ද පමණි.

හුළඟත්, ජලයත්, අයිසුත්, හිමත්, සිසිලත්, උණුසුමත් අවුරුදු දස ලක්ෂ ගණනක් තුළ ම දැඩි, හිස් පාෂාණ වෙනස් කළේය. මේවා පාෂාණ ලොකු ගල්වලටත්, ලොකු ගල් කුඩා ගල්වලටත් කුඩා ගල් බොරළුවලටත්, බොරළු පසටත් බින්දේය. මොවුහු, මෙසේ කැඩුණු පාෂාණ කැබෙලි එක තැනෙකින් තවත් තැනකට ගෙන ගියෝය. හැට විට ම මෙවැනි වැඩ කළ මොවුන් ක්‍රියා කළේ ඉතා සෙමෙන්ය. දැන් ද වැඩෙහි ම යෙදී ඇති මොවුහු පාෂාණත්, ගලුත්, පසත්, තැනින් තැන ගෙන යන්නෝය. ඒවා කඩන්නෝය. ඒවා එකිනෙක හා අතුල්ලන්නෝය. මේ කටයුත්තට කියනු ලබන්නේ ඛාදනයයි. ඛාදනය වූකලී ගෙවීයාමයි. පාෂාණවල ගෙවී යෑම අපේ පස ලබා ගැනීමට උපකාර විය.

හොඳ පසේ ඇත්තේ කැඩුණු පාෂාණ පමණක් නො වේ. කැඩී බිඳී ඇති පාෂාණවලින් පමණක් හැදුණු පසෙහි බොහෝ ශාක නො වැඩේ. වත්තේ තිබෙන පසෙහි උඩ කොටස දෙස බැලුව හොත් මැරුණු මුල්, පත්‍ර සහ කඳන් ද එහි බෙහෙවින් ඇති බව අපට පෙනෙනු ඇත. ඒවා වූකලී පස මත ජීවත් වී සිට මළ ශාකවල කොටස්ය. දැන් ඒවා කුණු වෙමින් පවතියි.

## පස සරුවීම

මුල් ම ශාක මළ පසු ඔවුන්ගේ දේහ ගොරෝසු පසෙහි කුණු විය. එවිට, පාසි නමින් හැඳින්වෙන කුඩා ශාක වැඩෙන්නට වණ. මේවායේ මුල්, ශාකවල මුල්වලට වඩා දිග විය. මේ මුල්වලින් ගොරෝසු පාෂාණත්, වැලිත් තව තවත් කැඩී කැඩී, බිඳී යන්නට පටන් ගත්තේය. ශාක මැරී කුණු විය. මෙසේ කුණු වුණු ශාකත් ගොරෝසු කුඩා පාෂාණ කැලිත් එකතු වී සෙමෙන් සෙමෙන් පස් තට්ටුවක් හැදුවේ.

තණකොළ, පඳුරු සහ ගස් ද ඊට පසු වැඩෙන්නට පටන් ගත්තේය. මේ ශාකවල මුල් මීට කලින් තිබුණු ශාකවල මුල්වලට වඩා දික් විය. මේ මුල්, පාෂාණ තුළට, මීට කලින් තිබුණු ශාකවල මුල් ගමන් ගත් ගැඹුරට වැඩී ගැඹුරකට ගමන් කළේය. පාෂාණ තව තවත් බිඳින්නට ද පසෙහි ඇති ගොරෝසු ඇට කුඩා ඇටවලට

පෙරළීමට ද මේවා උපකාර විය. මේ ශාක මළ පසු දිරා පත් ව පස් බවට පෙරළිණ. මෙය අවුරුදු ගණනාවක් තුළ ම සිදු විය. ශාකවල මුල්, කඳන් කොළ, මල් සහ ගෙඩි ද මැරී පොළොව මත දිරා පත් විය. පාෂාණවල කුඩා කැලිවලින් සහ දිරා පත් වුණු ශාකවලින් ද සැදි තට්ටුව සෙමෙන් සෙමෙන් වඩා ඝන විය.

හියුමස් නමින් අප විසින් හඳුන්වනු ලබන්නේ දිරා පත් වුණු ශාක කැලිය. අවුරුදු ලක්ෂ ගණනක් තිස්සේ පස තුළ දිරා පත් වුණු ශාකයන් ගේ ගණන අපමණයි.

පස්වලින් සැදි තට්ටුව කෙදිනෙකවත් ඉතා ගැඹුරු නොවන්නේය. තැනෙක අඩි කිහිපයක් ගැඹුරට ඇති මෙය තවත් තැනෙක අඟල් කිහිපයක් ගැඹුරට පමණි ඇත්තේ. මේ සියුම් පස් තට්ටුවය එය මත වැඩෙන ශාකවලට කෑම දෙන්-නේ.

## පස, අහර හා මිනිසා

**නිරෝගී වන්නට නම්, ශක්තිමත් වන්නට නම් හොඳ අහර ගතයුත්තමෝය අපි. අප කන බොහෝ දේ ශාකවල කොටස් නො වැ ? සතුන් ගේ කොටස් ද අපි කන්නෙමු. සත්තු ද ශාක කන්නෝය. ශාක සරු වියයුතුය. හොඳ පසෙන් පමණි හොඳ අහර ලබන හැක්කේ. නිසරු පසෙන් හොඳ අහර ලබන නො හැක.** හොඳ අහර ලබන්නට නම් අපි මේවා දත යුත්තතමෝය:

1. පස පිළිබඳ
2. ශාකවලට ඕනෑ අහර පිළිබඳ
3. ශාක අහර ලබා ගන්නා තැන් පිළිබඳ
4. නිසරු පස සරු කරන ක්‍රම පිළිබඳ
5. සරු පසේ සරු බව රැකීම පිළිබඳ

ඇඳුම්, පිහි, බයිසිකල ආදිය අපි පාවිච්චි කරන්නෙමු. කලක් පාවිච්චි වුණු පසු මේවා ගෙවී දිරන්නේය. මේ සියල්ල මිනිසුන් හඳන බඩුයි. **පස මීට වඩා වෙනස්ය. පස රැක ගැනීම අප දන්නේ නම් පස කෙදිනෙකවත් නොදිරණු ඇත. අවුරුදු දෙදහසකට අධික කාලයක් තුළ මිනිසුන් විසින් ආහාර වගා කරන ලද කුඹුරු යුරෝපයේත්, චීනයේත්, ජපානයේත් ඇත.** අවුරුදු සියයක් තුළ පමණක් ආහාර වගා වුණු කුඹුරු ඇමෙරිකාවේත් ඕස්ට්රේලියාවේත් ඇත්තේය. එහෙත්, මේ කුඹුරුවල පස දැන් නිසරුය. එසේ වුණේ පස රැකීමට මිනිසුන් නොදත් නිසයි.

## පස් හා පාෂාණ තට්ටු

පොළොවේ ඇති ගැඹුරු වළෙක උඩපස, යටිපස හා පාෂාණ ද නමැති තට්ටු තුනක් ඇතැම් විට අපට පෙනේ, මින් ඕනෑ ම තට්ටුවක් හැම තැන දී ම එක අයුරු ම නොපවතින්නේය. සෑහෙන පමණ ගැඹුරට හැරුව හොත් පාෂාණ හමු විය හැක. මේ පාෂාණ විටෙක ඉතා දැඩිය; විටෙක කළුය; විටෙක අළුය; විටෙක රතුය; විටෙක සුදුය.

පාෂාණවලට උඩින් ඇත්තේ යටි පසයි. උඩ පසට යටින් ඇත්තේ යටිපසයි. ඇතැම් විට යටි පස් තට්ටු ඉතා ගැඹුරුය. යටිපස යට, පාෂාණ ළඟ බොහෝ විට ඇත්තේ ලොකු ගල්ය. ලොකු ගල්වලට උඩින් කුඩා ගල්තිබෙන්නට බැරි නැත. කුඩා ගල්වලට උඩින් ඊටත් කුඩා ගල් තිබෙන්-නට පුළුවන. මේ ගල් අතර ඇත්තේ ගොරෝසු පසයි. යටිපසේ උඩ කොටස ගල් ටිකක් ඇති සියුම් පස වේ. බොහෝ විට, උඩ පසේ පාටට වඩා ලා පාටෙකි යටි පසේ බෙහෙවින් ම ඇත්තේ. රට හුණු ද යහමින් තිබේ නම් එහි පාට සුදට ඉතා කිට්ටු වියහැක.

ගස්වල දිග මුල් යටිපස තුළින් පහටළ වැඩෙන්නේය; පාෂාණ හමු වන තෙක් ම වැඩෙන්නේය. දිරා පත් වුණු කඳන්, කොළ හා පල ද කැලි මෙන් නැත යටිපසේ.

යටිපස උඩින් ඇත්තේ උඩපස් තට්ටුවයි. ශාකවලත් සතුන්ගේත් දිරූ කොටස් මෙහි බෙ-හෙවින් ඇත. එබැවින්, යටිපසට වඩා තද පාටක් දරයි මේ පස. **හොඳම උඩපස හියුමස්. එහි ගල් ඇත්තේ ටිකෙකි. ඇතැම් තැන එහි** ගැඹුර **අඟල් කිහිපයෙකි; ඇතම් තැනෙක අඩි ගණනක්ම ගැඹුරුය. එහෙත්, කොතැනෙක දීවත් බෙහෙවින් ගැඹුරු නැත මේ පස් තට්ටුව.**

උඩපසේ උඩ අඟල් දෙක තුනක් ගැඹුරට, ශාකවල දිරන කොටස් ද ඒවායේ ජීවත් වන මුල් ද බොහෝ විට ඇත්තේය; පාට ද කළුය. **පස මෙසේ හැදුණේ අවුරුදු ලක්ෂ ගණනක් ගත වී**

මෙනි. උඩපසයි පසේ වැදගත් ම කොටස. උඩ පස ගැන මේ පොත්වලින් බොහෝ දේ උගතහැක මිනිසාට බැරිය උඩපස තනන්නට. එහෙත් මිනිස්සු උඩ පස රැක ගත යුත්තෝය. නැති නම්, ශාල වැසි නිසා පැය කිහිපයෙකින් උඩ පස් ටොන් ගණන් හේදී යන්නට ඉඩ ඇත.

එකිනෙකට වෙනස් පස් ජාති දෙක තුනක් ටික ටික ලබා ගන්න. වැලි ටිකකුත් සොයා ගන්න. (මුහුද ළඟ නම් ඔබ වසන්නේ මුහුදු වෙරළේ වැලි ගතහැකිය) වේළන්න සියල්ල ම ඉරු එළියේ තබා. එක එක පසත්, වැලිත් සුදු කඩදසි මත වෙන ම දමා හොඳ හැටි තුනී කරන්න. ඒ එක එකේ ඇති අංශු දෙස බලන්න. කාචයක් තිබේ නම් ඉන් ද බලන්න. කාචයක් වූකලි කුඩා දේ ලොකු කර පෙන්වන පැතලි වීදුරු කැල්ලෙකි.

නොයෙක් නොයෙක් පස් ජාතිවල අංශු දෙස බැලූ විට ඒ එකිනෙකේ අංශු එක් එක් ප්‍රමාණයේ බව පෙනේ. කුඩා ගල් තරම් විශාල අංශු සහිත පසට කියනුයේ බොරළුයි. කාචයක් නැති ව පෙනෙන කුඩා අංශු සහිත පස හැඳින්වෙනුයේවැලි සහිත පස් මෙනි. කාචයක් නැති පස නොපෙනෙ න තරම් කුඩා අංශු සහිත පස මැටි පසයි.

### බොරළුපස

බොරළුපස හැදී ඇත්තේ කුඩා ගල් වැනි පොඩි පාෂාණ කැලිවලිනි. බොරළුපසේ කැලි බැලීමට කාචයක් නුවුවමනාය. අපේ ඇසට ඒවා පැහැදිලි ව පෙනේ. බොරළු බෙහෙවින් දැඩිය. ජලයේ දිය නොවන්නේය. මේ පස තුළින් ජලය ඉක්මනින් ගලා යන්නේය. බොහෝ ශාක බොර ළුපසේ මනා ව නො වැඩේ.

### වැලි සහිත පස

වැලිපස සෑදී ඇත්තේ කුඩා පාෂාණ කැබෙලි වලිනි. එය ඇල්ලූ විට ආගිල්ලට ගොරෝසු ගතියක් දැනේ. කාචයක් නැති ව මේ පසේ අංශු දකිතහැක. මේවා ද දැඩිය. අල්පෙනෙත්තකින් මේ පස් අංශු කඩන්නට බැරිය. මේ අංශු නොයෙ ක් හැඩහුරුකම් ඇති, නොයෙක් නොයෙක් පාට ඇති ඒවාය. කළු, රතු, කහ දුඹුරු සුදු නැමති පාට වලින් තිබෙන මේවා විටෙක පාරදෘශ්‍ය වේ. පාර දෘශ්‍ය අංශුවක් තුළින් විනිවිද පෙනේ. එකට නො ඇලේ මේවා. එක අංශුවක් හැම විට ම අනෙක් අංශුවෙන් වෙන් ව ඇති අතර අංශු අතර ඉඩක් ද ඇත්තේය. අතර ඇති ඉඩේ ඇත්තේ වාතයයි. වැලිපස තුළින්ජලය ඉක්මනට ගලනමුත් වැලිපස දිය නො වේ ජලයේ. ඉක්මනින් ම රත් වේ වැලි පස. මහ දවල් ඉර පායන විට වැලිපස පැගෙන අපේ පාවලට දැනෙන රශ්නය කෙතරම්ද? වැලිපස් පාග පාග, යන විට නැහෙන දූවිල්ල කෙතෙක් ද? සැහැල්ලුය, උණුසුම්ය, වියළිය වැලිපස. පිපාස සහිත එකෙකි මෙය. මුහුදු වැල්ලේ වැවෙන ශාක ගණන ස්වල්ප වන්නේ එය ඉතා උණුසුම් සහිත, බොහෝ ලුණු සහිත එකක් නිසාය.

### මැටි පස

මැටිපස හැදී ඇත්තේ ඉතා මත් කුඩා අංශු වලිනි. මේ අංශු ඇල්ලූ විට නො දැනේ ඇඟිල්ලට ගොරෝසු බවක්. කාචයක් ඕනෑය මැටිපසේ අංශු දකින්නට. එකිනෙකට ඉතා ළංවන මැටිපස් අංශු අතර ඇති වාතය හුගක් වන්නේ කෙසේ ද? තෙ මුණු මිට ඇලේ එකට මැටිපසේ අංශු, මැටිපස තුළින් ජලය ගලන්නේ සෙමෙනි. එනිසා මැටි පසේ ජලය රැඳේ යැයි කියමු අපි. බරය, තෙතය, සිසිල්ය මැටිපස. වේළුණු විට දැඩි වන මැටිපසේ ඉරි ද තලයි.

බොහෝ පස් මේ පස් වර්ග තුනේ මිශ්‍රණයි. කොටස් කිහිපයෙකින් සැදුණු දේ මිශ්‍රණයෙකි. එක එක පසේ මේ පස් තුන් වර්ගයෙන් එක් එක් ප්‍රමාණ ඇත. තනිකර බොරළුවල, තනිකර වැලි වල නො වැඩේ හොඳින් ශාක. ශාක කැමති මිශ්‍ර පසටයි.

### හියුමස් පස්

උඩපස ජලයේ කලතා ටික වේලාවක් බඳුන නොසොල්වා තැබූ විට පාෂාණ අංශු ගිලෙන්නේ ය. ඉන් පසු ජලය මතු පිට පා වේ මළ මුල් කැලි හා කොළ කැලිත්.

මළ ශාකයන්ගේ සහ සතුන්ගේ ද දේහ පොළොවට වැටෙන්නේය. වාතයේ සහ සතුන්ගේ ද දේහ පොළවට වැටෙන්නේය. වාතයේ සහ පසේ ද ජීවත් වන ඉතා ම කුඩා සත්තු මේ මළ දේහත් සතුන්නේ කසලත් අහර කොට ගෙන වසති. මේ සතුන්ට කියන්නේ ක්ෂුද්‍ර ජීවීන් කියායි.

බැක්ටීරියා යනු ද මුන්ට ම කියන නමෙකි. මුන්ගෙන් සමහරෙක් ගොවියාගේ මිතුරෝය. ක්ෂුද්‍ර ජීවීන් මළ ශාක ආහාර කොට ගෙන වසන විට ඒවා වෙනස් වන්නේය. මේ වෙනස් වීම තමා දිරාපත් වීම යනුවෙන් හැඳින්වෙන්නේ. මේ දිරාපත් වන ශාක පසෙන් ගත් ඇතැම් කොටස් පසට නැවත දෙන්නේය. ඒවා හියුමස් වී ඇතැයි අපි කියමු.

මෙන්න හියුමස් ගැන අප දන්නා ඇතැම් කරුණු;

1. හියුමස් කළුය: මෘදුය. උඩපසේ අඳුරු පාට බොහෝ විට ලැබෙන්නේ හියුමස් නිසාය.

2. හියුමස් ඉතා සැහැල්ලුය.

3. කුඩා හියුමස් කැලි අතර වාතය හැම විට ම තිබේ.

4. හියුමස් ජලයේ දිය නොවේ. එහෙත්, ක්ෂුද්‍ර ජීවීන් විසින් එය පෙරළනු ලබන ඇතැම් ශාක ආහාර නම් දිය වේ ජලයේ.

5. ජලය බොහෝ වෙලා රඳා ගක හැක හියුමස්වලට. එවිට, එහි ඇති ශාක ආහාර ජලයේ දිය වේ.

6. පස උණුසුම් ව තබා ගැනීමට හියුමස් උදවු කරයි. අඳුරු ද්‍රව්‍ය ලා පාට දේට වඩා උණුසුම්ම. ද්‍රව්‍ය දිරණ විට රශ්නය පිට වේ.

7. හියුමස් නිසා වැලි පස් එක් වන්නේය. මැටිපස් සැහැල්ලු වන්නේය. මේ පස්වලට හියුමස් වඩා හොඳ වයනයක් දෙතියි අපි කියමු. ද්‍රව්‍යයෙක වයනය යනු එය හැදී ඇති අයුරුයි.

8. පසේ ඇති බැක්ටීරියාවලට හියුමස් ගෙයකි.

9. ශාක දිරා පත් වන විට සෙමෙන් සෙමෙන් හියුමස් හැදේ. එබැවින්, අනෙක් ශාකවලට ඕනෑ අහර පසේ හැම විට ම තැනේ. දිරා පත් වන ශාකයක් අවුරුදු ගණනාවක් තිස්සේ ම පසට උපකාර කරන්නේය.

10. හියුමස් ශාක ආහාරයෙක් නො වේ. එහෙත්, ශාක ආහාර නිපැදවීමට එය උපකාරී වේ.

වනයේ ඇති ගස් යට හියුමස් බෙහෙවින් ඇත්තේය. අවුරුදු ගණනාවක් තුළ ම පස මත වැටුණේය කොළ මල්, ගෙඩි හා මළ අතු. වනයේ ඇති පස කළුය; සිනිඳුය; තෙතය. හැම අවුරුද්දේ ම මළ ශාක කොටස් වැඩි වැඩියෙන් පොළොව මත වැටෙන්නේය. හැම අවුරුද්දේ ම වන පස හොඳකමෙන් වැඩි වන්නේය.

උඩපස මතය හියුමස් තිබෙන්නේ. උඩපසේ ඇති හියුමස් ප්‍රමාණය ටික වියහැකිය, සෑහෙන පමණ වියහැකිය, බොහෝ වියහැකිය. උඩ පසෙන් කාලකටත් වැඩිය ඇත්තේ හියුමස් නම් එවැනි පසේ ශාක හොඳින් වැඩෙන්නේ නැත. සම්පූර්ණයෙන් ම පාහේ හියුමස්වලින් සැදි පස පීට්ය. අයර්ලන්තය වැනි රටවල පීට් බෙහෙවින් තිබේ. මිනිස්සු එය හාරති, එලති, ගිනිමැලවල දමා පුච්චති. පීට් (පස) බොහෝ විට ඉතා තෙතය. ඒ ජලයට එය දමා යන්නට බැරි නිසාය. ජලය පීට් සෑදීමට උපකාර වේ.

**හුණුපස්**

බොහෝ පස්වල හුණු ටිකක්වත් ඇත. කටුවල කොරල්වල' රටහුණුවල, හුණු තිබේ. හුහක් හුණු ඇති පසේ පාට සුදට කිට්ටු වේ. ඇඹිලිවලට ඉන් දුනෙන්නේ ගොරෝසු ගතියෙකි. හියුමස් මෙන් හුණු ද පසේ වයනයට උදව් දෙයි. වැලිපස් එකට ඇලී සිටින්නට සලසන හුණු මැටිපසේ බර සැහැල්ලු කරයි. පසෙක පමණට වැඩිය හුණු ඇත් නම් සමහර ශාක එහි නොවැඩෙනු ඇත.

## ඔබේ ගමේ ඇති පස කුමක් ද?

පසෙක බොහෝ බොරළු ඇති නම් ඒ බොරළු පසෙකි. වැලි වැඩියෙන් ඇති පස වැලිපස වන අතර මැටි වැඩියෙන් ඇත්තේ මැටිපසේය. පසෙක ඇති වැලිත් මැටිත් සම ප්‍රමාණයන්ගෙන් පමණ ඇත් නම් ඒ ලෝම්පසයි. මේ තමා හොඳ ම පස. සැහැල්ලු වැලිපස මෙන් වියළි නැත මේ පස; බර මැටිපස මෙන් තෙත නැත මේ පස.

නොයෙක් පස් ජාතිවල නම් මෙන්න:

$\frac{3}{4}$ ක් වැලිත් $\frac{1}{4}$ ක් මැටිත් ඇති පස වැලිපසයි.

මැට්ටට වඩා වැලි ඇති පස වැලි සහිත ලෝම් පසයි.

$\frac{1}{2}$ ක් වැලිත් $\frac{1}{2}$ ක් මැටිත් ඇත්තේ ලෝම් පසෙයි.

වැල්ලට වැඩියෙන් මැටි ඇත්තේ මැටි ලෝම පසෙයි.

¼ක් වැලිත්, ¾ක් මැටිත් ඇත්තේ මැටි පසෙහිය.

¼කට වැඩියෙන් හියුමස් ඇත්තේ පීට පසෙහීය.

හුණු ඇත්තේය මේ හැම පසෙකම ම බොහෝ වීට. එබැවින්, හැම පසෙක නමට ම "හුණු" යන වචනයත් ඇඳියයුත්තේය. එවිට ලැබෙන පස්වල නම් මෙසේය: හුණුවැලි, හුණුවැලි ලෝම්පස්, හුණු ලෝම්පස්, හුණුමැටි ලෝම්පස්, හුණු මැටිපස්

**"නිසරු" "සරු" "ඉතා සරු" යන වචන වලින් දක්වෙන්නේ පසෙක ඇති හියුමස් ප්‍රමාණය යි.** මෙන්න නිදසුන්; නිසරු හුණුවැලි ලෝම්පස ගැන, සරු හුණුවැලි ලෝම්පස ගැන හෝ ඉතාසරු හුණුවැලි ලෝම්පස ගැන හෝ අපි කථා කරමු. අනෙක් පස් ගැන ද මෙසේ මයි.

ඔබේ ගමේ ඇති පස කුමන පසක් දැයි සොයන්නේ මෙසේය:

## බොරළු, වැලි, මැටි වෙන් කිරීම

පස් පයින්ට් භාගයක් මැන ගන්න. පයින්ට් එකක් මැනීමේ මිම්මක් නැති නම් ටින් එකක් පාවිච්චි කර ගතහැක. රාත්තලේක මස් ටින් එකෙක පයින්ට් එකක් පමණ අල්ලයි. ටින් එක විශාල වූවාට කමක් නැත. එහෙත්, පස් වැඩි වුණු විට ඔබේ වැඩේ අපහසු වෙයි.

පස ගැඹුරු ටින් එකෙක හෝ බාල්දියෙක හෝ දමා ඊට ජලය වක්කොට හොඳින් කලතන්න. ටික වේලාවක් බාල්දිය නො සොල්වා තැබුව හොත් පසේ ඇති බොරළු අඩියට බසිනු ඇත. බොරළු තිබිය දී අපිරිසිදු වතුර වෙන බාල්දියකට ඉවත් කරන්න. පිරිසිදු ජලයෙන් බොරළු කීප විටක් ම සෝදමින් එසේ සෝදන හැම විට ම ලැබෙන අපිරිසිදු වතුර දෙවැනි බාල්දියට ඉවත් කරන්න. බොරළු සේදූ වතුර පිරිසිදු වන තෙක් සෝදන්න. බොරළු ඉන් පසු වේළන්න අවුවේතබා

දෙවැනි බාල්දියේ ඇති වතුර කලතන්න. ටික වේලාවකට පසු එහි පතුළට බසියි වැලි. වැලි මේ බාල්දියේ ම තිබිය දී හුණු සහිත අපිරිසිදු වතුර මුල් බාල්දියට ඉවත් කරන්න. බොරළු සේදූ සේ ම වැලි ද කීහිප විටක් සෝද සෝද අපිරිසිදු වතුර මුල් බාල්දියට ම ඉවත් කරන්න. වේළන්න වැලි ද අවුවේ තබා.

මැටි සහිත අපිරිසිදු වතුර බාල්දියේ දින ගණනක් තිබියයුතුය. මැට්ටට උඩින් ඇති වතුර පිරිසිදු වුණු විට, මැටි බාල්දියේ ඉතිරි කරමින්, ඉවත් කරන්න වතුර. වේලන්න මැටි ද අව්වේ තබා.

ජාති තුනක් ඔබ වෙන් කළේය. බලන්න ඒවා දෙස දැන්. වැඩිපුර ම ඇත්තේ කුමක් ද? කලින් දක්වුණු පස් ජාතිවල නම් දෙස නැවත බලා ඔබේ පසට සුදුසු නම කුමක් දැයි බලනු වටී.

ඔබ ළඟ තරාදි තිබේ නම් වියළි පස පළමුව ද බොරළු, වැලි සහ මැටිත් ඊ ළඟට ද කිරතහැක්කේය.

## පසේ හියුමස් ප්‍රමාණය සෙවීම

මුලින් ගත් පමණ ම පස් රැගෙන වේළා, ටින් පියනක් මත තුනී කරගන්න. පියන ගින්නක් මත බතා රත් වුණු පසු පස සෙමෙන් කාල් ගාන්න. තුඩා හියුමස් කැලි රත් ව පොඩි ගිනි පුපුරු පිට කරමින් පිච්චෙනු ඇත. ගිනි පුපුරු පිට වීම නැවතෙන්නේ හියුමස් පිච්චී ඉවර වුණු පසුය. ගිනි පුපුරු බෙහෙවින් පිට වුණි නම් ඉන් ඇඟෙන්නේ පස හියුමස්වලින් පොහොසත් බවයි. ගිනි පුපුරු ටික නම් පිට වුණේ පසේ වැඩිපුර හියුමස් නැත.

තරාදියක් තිබේ නම් හියුමස්වල බර සොයත හැක. මුලින් ගත් පස් කිරා, හියුමස් පිච්චුණු පසු ඉතිරි වන පස ද කිරීමෙනි මෙය කළ හැක්කේ. කිරුම් දෙකේ වෙනසින් හියුමස්වල බර ලැබේ.

## පසේ හුණු ඇත් දැයි සෙවීම

සල්පියුරික්, හයිඩ්‍රොක්ලෝරික් වැනි දුර්වල අම්ලයක් මේ සඳහා වුවමනාය (අම්ලයක් වූකලි වෙනත් ද්‍රව්‍ය දිය කරන තද ඇඹුල් රසයක් ඇති දියරයකි) අම්ලය පස මත වක්කර කැලැතු වීට බුබුලු නගිනු ඇත. බෙසමක් හෝ වීදුරුවක් හෝ පස තැබීමට ගතයුතුයි. බොහෝ බුබුලු පිට වන්නේ නම් පසේ යහමින් හුණු ඇත.

**(ජී. ක්‍රෝස් විසින් සැකැසුණු 'ද ෆාමර්ස් නමැති පොත සඳහා හර්බට් වී. ඇස්. ගුණසේකර විසින් කෙරුණු 'මුල්ම ගොවියෝ' නමැති අනුවාදයෙන් උපුටා ගන්නා ලදී)**